**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Sabaragamuwa Provincial Department of Education**

**පළමු වාර පරීක්ෂණය - 2018** **9 ශ්‍රේණිය**
**1 st Term Test 2018**

**ඉතිහාසය I,II** **කාලය පැය : 2**
**History- I , II** **Two hours**

**ඇතුලත් වීමේ අංකය : ..............................** **පන්තිය : ......................**
**නම : ..............................................................................**

## I කොටස

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01 . ලන්දේසීන්ගේ මව් රාජ්‍යය ලෙස සැලකෙන රට වන්නේ ,
i. පෘතුගාලය ii. ඕලන්දය iii. බෙල්ජියම iv. ස්පාඤ්ඤය

02. ලන්දේසීන් තම පෙරදිග මූලස්ථානය බවට පත්කර ගත්තේ ,
i. කොළඹ ii. බතාවිය iii. මද්‍රාසිය iv. කැලිකට්

03. ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි ජාතිකයා ලෙස සැලකෙන්නේ ,
i ලොරෙන්සෝද අල්මේදා ii. ප්‍රැන්සිස්කෝ ද අල්මේදා
iii. පර්නාවෝ කෝට්රීම් iv. ජොරිස් වැන් ස්පිල් බර්ජන්

04. ලන්දේසීන් මෙරටට පැමිණෙන විට මෙහි රජ කළ රජතුමා වන්නේ ,
i. පළමුවන විජයබාහු ii. පළමුවන පරාක්‍රමබාහු
iii. පළමුවන විමලධර්මසූරිය iv. රාජාධිරාජසිංහ

05. අනිසි හැසිරීම් නිසා ජීවිතක්ෂයට පත්කළ ලන්දේසි දූත පිරිසේ නායකයා වූයේ ,
i. ජොරිස් ෆන් ස්පිල් බර්ජන් ii. සී බෝල්ට් ද වාර්ට්
iii. ෆන් හුන්ස් iv. ෆන් එක්

06. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට මුල් වූ රජතුමා වන්නේ ,
i. රාජාධිරාජසිංහ ii. දෙවන රාජසිංහ
iii. සෙනරත් රජු iv. ශ්‍රී වික්‍රම රාජසිංහ

07. ලන්දේසීන් සමග අත්සන් කළ ගිවිසුමක් නිසා ශ්‍රී ලාංකිකයන්ට විශාල අසාධාරණයක් සිදුවිය.මෙම ගිවිසුම අත්සන් කල වර්ෂය වනුයේ ,
i.ක්‍රි.ව 1505 ii. ක්‍රි.ව 1766 iii. ක්‍රි.ව 1638 iv. ක්‍රි.ව 1605

08. ''ඉගුරු දී මිරිස් ගත්තා වැනිය ''මෙම කියමන හා සම්බන්ධ සිංහල රජතුමා වන්නේ ,
i. පළමු විමලධර්මසූරිය ii. දෙවන රාජසිංහ
ii කරලියද්දේ බංඩාර iv. ශ්‍රී විජය රාජසිංහ

09. උඩරට රාජ්‍යයට ඇතුළු වීමේදී බදු අය කළ ස්ථාන හැඳින් වූ නාමය වන්නේ ,
i. ගිරි දුර්ග ii. කඩවත් iii. කෝරළ ඉම iv. දිසාවනිය

10. නායක්කර් වංශික රජවරුන්ට අනුශාසනා කළ භික්ෂූන් වහන්සේ වූයේ ,
i. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ii. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
iii. වැලිවිටියේ ශ්‍රී සරණංකර හිමි iv. තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල හිමි

11 . පළමුවන නායක්කර් වංශික රජතුමා වන්නේ ,
i. දෙවන රාජසිංහ ii. ශ්‍රී විජය රාජසිංහ iii. රාජාධි රාජසිංහ iv. ශ්‍රී වික්‍රම රාජසිංහ

12 . ප්‍රථම කෝපිවත්ත ඇතිකළ පුද්ගලයා වන්නේ ,
i. නිකී බර්ඩ් ii. ජෝන් ලොක් iii. ජෝර්ජ් බර්ඩ් iv. එඩ්වන් බ්‍රවුන්

13 . ගම්පොල සිංහපිටියේ ප්‍රථම වරට ඇතිකළ ආර්ථික බෝගයකි ,
i. කොකෝවා ii. කෝපි iii.තේ වගාව iv. රබර් වගාව

14 . ශ්‍රී ලංකාවේ ආදායම් තත්වය ඉහළ නැංවීම සඳහා සොයා බැලීමට පැමිණි කොමිෂන් සභාව වන්නේ ,
i. ජෝන් සහ සමාගම ii. මැනින් කොමිසම
iii. කෝල්බෲක් කොමිසම iv. මැකලම් කොමිසම

15 . සින්කෝනා වලින් නිපදවනු ලබන්නේ ,
i. චොක්ලට් නිපදවීමයි ii. ක්විනින් නැමති ඖෂධයකි
iii. පානයක් ලෙස භාවිතා කිරීම iv. ප්‍රධාන ආහාරයකි

16 . ඇහැලේපොළ කුමාරිහාමි දියෙහි ගිල්වා මරා දමන ලද ස්ථානය ලෙස සැලකෙන්නේ ,
i. බෝගම්බර වැව ii. නුවර වැව iii. කන්තලේ වැව iv. කලා වැව

17 . ලැන්ඩ්රාද් උසාවිවල විභාග වූ නඩු වූයේ ,
i. අපරාධ නඩු ii. ඉඩම් නඩු iii. රජයේ නඩු iv. සිවිල් නඩු

18 . පෙරදිග රටවල වෙළඳාම් කටයුතු සඳහා පිහිට වූ සමාගම වන්නේ ,
i. පෙරදිග ජෝන් සමාගම ii. ප්‍රංශ ඕලන්ද වෙළඳ සමාගම
iii. පෙරදිග වෙළඳ කටයුතු සංගමය iv. පෙරදිග ඕලන්ද සමාගම

19 . ශ්‍රී ලංකාවේ පාලන ඉතිහාසයේ අවසාන සිංහල රජතුමා වන්නේ ,
i. ශ්‍රී වික්‍රම රාජසිංහ ii. කීර්ති ශ්‍රී රාජසිංහ
iii. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ iv. ශ්‍රී විජය රාජසිංහ

20 . ලන්දේසීන් මෙරටට හඳුන්වා දුන් නීතිය වන්නේ ,
i. ඉංග්‍රීසි පෘතුගීසි නීතිය ii. පෘතුගීසි ලන්දේසි නීතිය
iii.ඕලන්ද පෘතුගීසි නීතිය iv. රෝම ලන්දේසි නීතිය

## II කොටස

පළමුවන ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. (i) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.
මහනුවර ,ත්‍රිකුණාමලය ,ගාල්ල ,මන්නාරම ,කොළඹ

ii - I ප්‍රශ්නය සඳහා රූපය



ii - I රූපය ඇසුරින් අසාව ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a ) මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද ?

(b) 1656 වර්ෂයේදී ඔහු මුණගැසීමට පැමිණි ලන්දේසි දූතයා කවුද?

(c) මෙම රජු හා ලන්දේසින් අතර ලිපි හුවමාරුවේදී
රජු සඳහන් කළ පාඨය කුමක්ද ?

ii - II **ප්‍රශ්නය**

ii - II ප්‍රශ්නය සඳහා රූපය



(a ) මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද ?

(b) මෙම දේවිය විවාහ වී සිටියේ කා සමගද?

(c) මෙම රජු හා බිසව සැඟව සිටියේ කවර ස්ථානයකද ?

iii ) කෙටි පිළිතුරු සපයන්න.

(a ) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින් දළදා මාලිගාවට එක් කරන ලද අංගය කුමක්ද ?

(b) ලන්දේසි ආණ්ඩුකාරවරයා අමතා විලියම් කුමරු නිකුත් කළ ලිපිය කුමක්ද ?

(c) ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවුද ?

(d ) ඉංග්‍රීසීන්ට විරුද්ධව පළමු නිදහස් සටහන ඇතිවූ වසර කුමක්ද ?

02. (i) ශ්‍රී ලංකාවේ රාජ්‍යය කළ නායක්කාර් රජවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) දිවයිනේ ලන්දේසීන් යටතේ පැවති ප්‍රදේශ ප්‍රධාන කොටස් 03 කට බෙදා තිබුණි.මෙම කොමාන්ඩරි 03 නම් කරන්න. (ලකුණු 03 යි )

(iii ) ලන්දේසි පාලනය නිසා ඇති වූ සමාජ හා සංස්කෘතික බලපෑම් 3ක් ලියා ඉන් එකක් විස්තර කරන්න.
(ලකුණු 05 යි )

03. (i) බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමුවීමට හේතු 2 ක් ලියන්න.
(ලකුණු 02 යි )

(ii) 1796 වර්ෂයේ සිට 1815 දක්වා උඩරට රාජධානිය යටත් කරගැනීම දක්වා මුහුදු බඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය පාලනයේ කැපී පෙනෙන අවස්ථා 03 ක් ලියන්න.
(ලකුණු 03 යි )

(iii )බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමුවීමට ත්‍රිකුණාමලය වරාය වැදගත් වූ ආකාරය විස්තර කරන්න.
(ලකුණු 05 යි )

04. (i) කීර්ති ශ්‍රී රාජසිංහ රජු පරිහානියට පත්ව තිබූ බුදු සසුන නගාසිටුවීමට කළ සේවාවන් 2 ක් ලියන්න.
(ලකුණු 02 යි )

(ii) 1766 දී ලන්දේසි ආණ්ඩුකාර වූ විලෙම් පැල්ක් හා රජු අතර ඇති වූ ගිවිසුමේ වගන්ති 2 ක් ලියන්න.
(ලකුණු 03 යි )

(iii ) ලන්දේසීන්ගේ පාලන සංවිධානය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි )

05. (i) ප්‍රථම වරට මුද්‍රණ යන්ත්‍රයක් මෙරටට ගෙන ඒමේ ගෞරවය හිමි වන්නේ කුමන ජාතීන්ටද? එහි ප්‍රථම වරට මුද්‍රණය කළේ කුමක්ද ?. (ලකුණු 02 යි )

(ii) ඉඩම් අයිතිය හා අයකළ බදු ආදී විස්තර ඇතුළත් තෝම්බු ක්‍රමය විධිමත් කරමින් ලන්දේසීන් තෝම්බු වර්ග 3 ක් හඳුන්වා දී තිබුණි. ඒ මොනවාද ?
(ලකුණු 03 යි )

(iii ) ලන්දේසීන් මෙරට පරිහරණයට හෝ වෙළඳාමට යොදගත හැකි දේ නිපදවීමට අමතර ආදායම් ලබා ගැනීමට කටයුතු කළ ආකාරය කරුණු 03 ක් ඇසුරින් විග්‍රහ කරන්න.
(ලකුණු 05 යි )

06. (i) ලන්දේසීන්ගේ ආගම කුමක්ද ? (ලකුණු 02 යි )

(ii) ඔවුන් ආගම පැතිරවීමට ගත් ක්‍රියාමාර්ග 3 ක් ලියන්න. (ලකුණු 03 යි )

(iii ) ලන්දේසි පාලනය යටතේ අධිකරණ ක්ෂේත්‍රයේ උසාවි පද්ධතිය බෙදී තිබූ ප්‍රධාන උසාවි 4 හා විභාග වූ නඩු මොනවාද ?
(ලකුණු 05 යි )

07. (i) 1818 නිදහස් සටනට හේතු 2 ක් ලියන්න. (ලකුණු 02 යි )

(ii) 1818 නිදහස් සටනට නායකත්වය දුන් තිදෙනෙක් නම් කරන්න.
(ලකුණු 03 යි )

(iii ) 1818 සටන අසාර්ථක වීමය බලපෑ හේතු 4 ක් ලියන්න.
(ලකුණු 05 යි )

**01- i ප්‍රශ්නය සඳහා සිතියම**



**I වාර පරීක්ෂණය 2018 9 -ශ්‍රේණිය ඉතිහාසය පිළිතුරු පත්‍රය**

I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1) ii | 6) ii | 11) ii | 16) i |
| 2) ii | 7) iii | 12) iii | 17) ii |
| 3) iv | 8) ii | 13) ii | 18) iv |
| 4) iii | 9) ii | 14) iii | 19) iii |
| 5) ii | 10)iii | 15) ii | 20) iv |

ii පත්‍රය සඳහා පිළිතුරු

01. (i) සිතියම

(ii) i ( a ) දෙවන රාජසිංහ රජු (b) ජෙනරල්ඩ් ජෙරාඩ් හල්ෆ්ට් (c) මට සේවය කරන හිතවත් ලන්දේසි ජාතිය

ii ( a ) රංගම්මා දේවිය (b) ශ්‍රී වික්‍රම රාජසිංහ (c) මැදමහනුවර බෝමුරේ

(iii ) ( a ) පත්තිරිප්පුව (b) කිවි ලිපිය (c) ෆෙඩ්රික් නෝත් (d) 1818

02. (i) ශ්‍රී විජය රාජසිංහ ,රාජාධි රාජසිංහ ,කීර්ති ශ්‍රී රාජසිංහ ,ශ්‍රී වික්‍රම රාජසිංහ,

(ii) කොළඹ කොමාන්ඩරිය ,ගාලු කොමාන්ඩරිය ,යාපනය කොමාන්ඩරිය.

(iii) රොම ගෘහ නිර්මාණ ශිල්පය අනුගමනය කරමින් ඉස්තෝප්පුව ,සොල්දරය ,කුලුණු හා උස් වහල යෙදූ නිවාස ඉදිකිරීම ,විවිධ ආහාර වර්ග රාශියක් හඳුන්වා දීම ,උසාවි ක්‍රමය හඳුන්වා දීම ,මෙරට සමාජයට බර්ගර් (ලංසි) ජනතාව එකතුවීම ,සිංහල හා දෙමළ භාෂාවලට ලන්දේසි වචන විශාල ප්‍රමාණයක් එකතු වීම.

03. (i) ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම ,ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම ,වෙළඳ කටයුතුවලදී ශ්‍රී ලංකාවේ තිබූ වැදගත් කම.

(ii) 1796-1798 දක්වා පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම යටතේ පාලනය ,1798-1802 දක්වා ද්විත්ව පාලනය, 1802 සිට බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය

.

(iii ) බෙංගාල බොක්කට හා අග්නිදිග ආසියාවට මුහුණලා ඇති ස්වාභාවික වරායක් වීම ,රට තුළට නෙරාගිය ස්වාභාවික වරායක් වූ බැවින් අනතුරුදායක සුළි සුළංවලින් නැව් ආරක්ෂා කරගත හැකි වීම , ඉංග්‍රීසීන් ඉන්දියන් සාගරයේදී ප්‍රංශ ජාතිකයින් සමග ගෙන ගිය නාවික සටන් වලදී ත්‍රිකුණාමල වරාය යුධමය අතින් වැදගත්වීම.

04. (i) ලන්දේසීන්ගෙන් නැව් ලබාගෙන උපසම්පදාව ගෙන ඒම සඳහා දූත කණ්ඩායම් සියම් දේශයට යැවීම

(ii) උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂු පිරිස මෙහි වැඩමවා 1753 දී ලංකාවේ උපසම්පදාව පිහිටුවීම ,සියම් නිකාය ආරම්භ කිරීමට මං පෑදීම.

(iii) 12 පිටුව බලන්න.

05. (i) ලන්දේසි ජාතීන්ට ,බයිබලයේ කොටසක්

(ii) පවුල් ,ඉඩම් ,පාසල් ,

(iii) මුතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම ,යෝධ වැව හා කන්තලේ වැව ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම මගින් වී නිෂ්පාදනය වැඩි කිරීමට උත්සාහ කිරීම ,උක් ,ගම්මිරිස් ,එනසාල් ,කෝපි ආදි වගා දියුණු කිරීම,රෙදි සායම් ,රෙදි විවීම් ,උළු ගඩොල් ,කර්මාන්ත දියුණු කිරීම ,හැමිල්ටන් ඇල වැනි ඇල මාර්ග ඉදිකොට භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම, යාපනය ප්‍රදේශයේ දුම්කොල වගා කරවීම, තල් ගස් කදන් අපනයනය

06. (i) රෙපරමාදු ආගම

(ii) ඕලන්දයෙන් දේවගැතිවරුන් ගෙන්වා ගැනීම ,දේවස්ථාන ඉදිකිරීම, ඉස්කෝල නම් ආයතන ඇති කිරීම, රෙපරමාදු ආගමේ යාඥා පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම.

(iii ) රාද් වැන් ජස්ට්ටි -අපරාධ නඩු, සිවිල් රාද් -රික්ස් ඩොලර් 120 අඩු අලාභ නඩු /විවාහ, ලැන් රාද් /ඉඩම් උසාවි -සරල වියදම් අඩු නඩු, පිස්කල් උසාවි /දිසාවේ උසාවි

07. (i) රජෙකු නොමැතිකම නිසා ජනතාව තුළ ඇතිවූ කලකිරීම, බ්‍රිතාන්‍යයන්ගේ පාලනය යටතේ බුදු දහම විනාශ වෙතැයි බියක් ඇතිවීම, දේශීය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් නොසලකා හැරීම, රදල ප්‍රධානීන්ගේ බලතල වරප්‍රසාද හා ආදායම් මාර්ග සුරක්ෂිත නොවීම

(ii) කැප්පෙටිපොල නිලමේ, මඩුගල්ලේ දිසාවේ, කිවුලෙගෙදර මොහොට්ටාල, පිළිමතලාවේ දෙවන අධිකාරම්, බූටැවේ රටේ රාල, කොහු කුඹුරේ රාල .

(iii ) 37 පිටුව
සටන විධිමත් ලෙස සංවිධානය වී නොතිබීම, සටන මෙහෙය වූ නායකයන් අතර තිබූ පෞද්ගලික අමනාපකම්

**දීපිකා මුණසිංහ මිය - කෑ/දෙහි/ කඩිගමුව ක.වි. - ගලපිටමඩ**